# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2185/41 - 2020 ජූලි මස 21 වැනි අඟහරුවාදා - 2020.07.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

මුද්‍රාව

ගෝඨාභය රාජපක්ෂ

**ජනාධිපති විධානය**

1. මාර්ෂල් ඔෆ් ද එයාර් ෆෝර්ස් රොෂාන් ගුණතිලක මැතිතුමා
2. අද්මිරාල් (විශ්‍රාමික) ජයන්ත පෙරේරා මැතිතුමා
3. රියර් අද්මිරාල් (විශ්‍රාමික) ආනන්ද පීරිස් මැතිතුමා
4. මේජර් ජනරාල් (විශ්‍රාමික) සුමේධ පෙරේරා මැතිතුමා
5. වෛද්‍ය බන්දුල විජේසිරිවර්ධන මැතිතුමා
6. වෛද්‍ය වජිර සේනාරත්න මැතිතුමා

වෙත,

ශුභාශිංසන පෙරටුවයි !

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවෙන් මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින් 2020.04.27 වැනි දින දරන ජනාධිපති විධානය මගින් පිහිටුවන ලද ත්‍රිවිධ හමුදා සාමාජිකයින් කොරෝනා වෛරසය ආසාදනයෙන් වළක්වා ගැනීම සඳහා සෑම හමුදාවක් විසින්ම ගත යුතු ක්‍රියා මාර්ග අධ්‍යයනය කර එකී පියවර ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් ලබාදීම පිණිස පත්කරන ලද කාර්ය සාධක බලකායේ සාමාජිකයින් වශයෙන් ඔබතුමන්ලා පත් කරනු ලැබ ඇති හෙයින් ද,

වර්තමානයේ දී මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් සහ බන්ධනාගාර රැඳවියන් අතර කොරෝනා වෛරසය ආසාදනය වීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කරනු ලබන හෙයින් ද,


1A - G 032324 — 32 (2020/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මෙම වෛරසය පැතිරීම පාලනය කර ගැනීම සහ සමාජගත වීම වළක්වා ගැනීම සඳහා ඉතා කඩිනම් හා ක්ෂණික ක්‍රියා මාර්ග ගැනීම අත්‍යවශ්‍ය කරුණක් බව මා විසින් හඳුනාගෙන ඇති බැවින් ද,

ඒ අනුව, උක්ත ජනාධිපති කාර්ය සාධක බලකායේ විෂයපථය පුළුල් කිරීම සිදු කළ යුතු බවට මා අදහස් කරන හෙයින් ද,

උක්ත ජනාධිපති විධානය මගින් ඔබ වෙත පවරා ඇති විෂයපථය තුළට ත්‍රිවිධ හමුද සාමාජිකයින්ට අමතරව, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වී පුනරුත්ථාපනය වන පුද්ගලයින් සහ බන්ධනාගාර රැඳවියන් ද ඇතුළත් කරමි.

ඒ අනුව, උක්ත විධානය මගින් ඔබ වෙත පවරා ඇති කාර්යයන් ඉටු කිරීමේදී මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වී පුනරුත්ථාපනය වන පුද්ගලයින් සහ බන්ධනාගාර රැඳවියන් සම්බන්ධයෙන් ද අදාළ කාර්යයන් ඉටුකළ යුතු බව මෙයින් විධානය කරමි.

වර්ෂ දෙදහස් විස්සක් වූ ජූලි මස 16 වැනි දින වූ මෙදින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

**පී. බී. ජයසුන්දර,**
ජනාධිපති ලේකම්.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.